# තෝමස් කුන් ගේ විද්‍යා දර්ශනයෙන් මතු වන සාපේක්ෂතාව පිළිබඳ විමර්ශනයක්

දර්ශනයෙහි එක් අංගයක් වන දැනුම පිළිබඳ විග්‍රහය හෙවත් ඥාන විභාගය (Epistemolgy) කෙරෙහි නූතන ලාංකේය දායකත්වය මහාචාර්ය නලින් ද සිල්වා ගේ නිර්මාණාත්මක සාපේක්ෂතාවයි. (Constructive Relativism) මෙම ලිපියෙහි අරමුණ නිර්මාණාත්මක සාපේක්ෂතාව බිහි කිරීමෙහි ලා නලින් ද සිල්වා කෙරෙහි බලපෑ එක් විද්වතකු වන තෝමස් කුන් ගේ විද්‍යා දර්ශනයෙන් මතු වන සාපේක්ෂතාව පිළිබඳ කෙටි විමර්ශනයක් සිදු කිරීමයි.

දැනුමෙහි සාපේක්ෂතාව පිළිබඳ ඉතිහාසය මදක් විමසා බලමු. සියලු දැනුම් පද්ධතිවල උල්පත ග්‍රීසිය යැයි සලකන බටහිර දර්ශනයට අනුව (මෙය සාවද්‍ය වේ.) දැනුම පිළිබඳ සාපේක්ෂතාවේ පියවරුන් ලෙස සැලකෙන්නේ ක්‍රි.පූ. 5 වන සියවසේ පමණ ග්‍රීසියේ විසූ විතණ්ඩවාදීන් (Sophists) නම් දාර්ශනික ගුරු කුලයයි. මේ විතණ්ඩවාදීහු වෙනත් නම්වලින් ද හඳුන්වනු ලැබූ හ. එනම් ප්‍රාඥයින් සහ සංචාරක ගුරුවරුන් ආදී වශයෙනි. ග්‍රීක භාෂාවට අනුව සෝෆිස්ට්ස් (Sophists) යන වචනයේ නිරුක්තිය දෙස බලන විට Sophia යන්නෙන් "ප්‍රඥාව" යන්න අර්ථවත් වේ. ග්‍රීක විතණ්ඩවාදීන් අතර ප්‍රධානතම වන්නේ ප්‍රොටගෝරස් (Protagorus) හා ගෝගියාස් (Gogias) ය. මේ දෙදෙනා ගෙනුත් වඩා කැපී පෙනෙන සාපේක්ෂතාවාදියා ප්‍රොටගෝරස් ය. ඔහු සත්‍ය, යහපත ආචාරධර්ම යනාදිය පිළිබඳව පොදු හා වාස්තවික මිනුම් දඬු නොමැති බව අවධාරණය කළ අතර මිනිසා ගේ පුද්ගලභාවයට හා මිනිස් අනුභූතියට ප්‍රමුඛස්ථානය ලබා දුන්නේ ය. ප්‍රොටගෝරස් ගේ ප්‍රසිද්ධ කියමනක් නම් "සෑම දෙයක ම මිනුම් දණ්ඩ වනාහි මිනිසා ය" යන්නයි. (Man is the measure of all things) මේ කියමන බුදුන් වහන්සේ ගේ පහත සඳහන් සූත්‍රකට දේශනාව සිහියට නංවයි. එනම් "මේ සිත් පිත් සහිත බඹයක් පමණ සිරුරෙහි ලෝකයත්, ලෝකයේ හටගැනීමත්, ලෝක නිරෝධයත්, ලෝක නිරෝධයට පැමිණෙන මාර්ගයත් පනවමි" (*අංගුත්තර නිකාය.*)

විතණ්ඩවාදීන් ගේ මත වඩා සුප්‍රසිද්ධ ග්‍රීක දාර්ශනිකයින් වන සොක්‍රටීස්, ප්ලේටෝ හා ඇරිස්ටෝටල් යන අය ගේ දැඩි විවේචනයට ලක් විය. මෙසේ බටහිර දර්ශනය විසින් පසෙකට තල්ලු කර දමනු ලැබ තිබූ දර්ශනයේ සාපේක්ෂතාවට නව ජීවයක් හා ජවයක් ලබා දෙන සංකල්ප කිහිපයක් ක්‍රි.ව. එක් දහස් නව සිය හැට (1960) ගණන්වල මුල් භාගයේ දී විද්‍යා දර්ශනය හරහා කරළියට පැමිණියේ ය. මෙය සිදු කරන ලද්දේ තෝමස් කුන් (Thomas kuhn) නම් විද්‍යා දාර්ශනිකයා විසිනි.

තෝමස් කුන් ගේ පසුබිම සලකා බලමු.

මොහු වර්ෂ 1922 ඇමෙරිකා එක්සත් ජනපදයේ සින්සිනාටිහි උපත ලැබී ය. වර්ෂ 1943 දී හාර්වඩ් (Haward) විශ්වවිද්‍යාලයෙන් භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබාගත්තේ ය. ඔහු වර්ෂ 1949 හාර්වඩ් විශ්වවිද්‍යාලයෙන් ම සෛද්ධාන්තික භෞතික විද්‍යාව (Theoritical physics) පිළිබඳව සිය ආචාර්ය උපාධිය ලබාගත්තේ ය. වර්ෂ 1961 දී ඔහු කැලිෆෝනියා විශ්වවිද්‍යාලයේ විද්‍යාවේ ඉතිහාසය පිළිබඳ මහාචාර්ය ධුරයට පත් කරන ලදී. 1964 සිට 1979 දක්වා තෝමස් කුන් ප්‍රින්ස්ටන් විශ්වවිද්‍යාලයේ විද්‍යාවේ දර්ශනය හා ඉතිහාසය පිළිබඳ මහාචාර්යවරයා වශයෙන් සේවය කළේ ය. 1979 දී මැසචුසෙට්ස් තාක්ෂණික ආයතනයේ (MIT) විද්‍යාවේ දර්ශනය හා ඉතිහාසය පිළිබඳ මහාචාර්ය ධුරයට පත් වූ හෙතෙම වර්ෂ 1996 ජනවාරි මස 19 දින පිළිකා රෝගයෙන් මිය යන තෙක් එම ආයතනයේ සම්මානිත මහාචාර්ය ධුරය හෙබවී ය.

සෛද්ධාන්තික භෞතික විද්‍යාවෙන් දර්ශනශූරී උපාධිය ලත් තෝමස් කුන්ට හාර්වඩ් විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨයෙන් වර්ෂ 1950 ගණන්වල දී අග භාගයේ දී පමණ මානව ශාස්ත්‍ර හදාරන සිසු සිසුවියන්ට බටහිර විද්‍යාවේ ඉතිහාසය පිළිබඳව දේශන මාලාවක් කරන ලෙස ආරාධනාවක් ලැබුණි. මෙම ආරාධනාව භාරගත් කුන් පුස්තකාල හා ලේඛනාගාර පීරමින් බටහිර විද්‍යාවේ ඉතිහාසය ගවේෂණයෙහි නිරත විය. එහි දී ඔහුට බටහිර විද්‍යාව ගලා යාමේ එක්තරා රටාවක් හඳුනාගත හැකි විය. එනම් විද්‍යාව ස්වකීය ඉතිහාසයේ දීර්ඝ කාල පරාසයක් තුළ නිසංසලේ ගලා යන අතර ඉඳහිට මහා කැළඹිලි සහිත විප්ලවයන් සිදු වන බව කුන් නිරීක්ෂණය කළේ ය. ඔහු එම දීර්ඝ නිසංසල

කාල පරාසයන්හි සිදු කෙරෙන විද්‍යාව සාමාන්‍ය විද්‍යාව (Normal Science) ලෙසත්, ඉඳහිට සිදු වන මහා විප්ලවකාරී ජවනිකා (Episodes) විප්ලවීය විද්‍යාව (Revolutionary Science) ලෙසත් හැඳින්වී ය.

විද්‍යාවේ සිදු වුණු කැපී පෙනෙන විප්ලව ඔහු ගේ නොමඳ අවධානයට ලක් විය. මේ අතරින් කොපර්නිකස් විද්වතා විසින් සිදු කෙරුණු සෞරග්‍රහ මණ්ඩලයේ චලිතය සම්බන්ධ ජවනිකාව විශේෂ ස්ථානයක් ගත්තේ ය. කුන් මේ ජවනිකාව අළලා කොපර්නිකානු විප්ලවය (Corpornican Revolution) නමින් වෙන ම කෘතියක් සම්පාදනය කළේ ය. බටහිර විද්‍යාවේ ඉතිහාසය පිළිබඳ සිය ගවේෂණයෙන් මතු වුණු කරුණු කුන් මවිතයට පත් කළේ ය. තමා ඇතුළු විද්‍යාව හැදෑරූ හා එහි නිරත වන සෑම දෙනාට ම බටහිර විද්‍යාව පිළිබඳව එතෙක් ලබා දී තිබුණු මත කෙතරම් සාවද්‍ය දැයි කුන්ට ප්‍රත්‍යක්ෂ විය. වර්තමානයේ පවා විද්‍යාව හදාරන්නන්ට පාසල් හා විශ්වවිද්‍යාල ඔස්සේ ලබා දෙන අධ්‍යාපනයට අනුව බටහිර විද්‍යාව සුවිශේෂී (Unique) දැනුම් පද්ධතියක් බවත්, එය පුද්ගලයින් ගේ විශ්වාස, ඇදහිලි හා හැඟීම් ආදියෙන් ස්වායත්ත බවත්, එය හේතුවාදී හෝ බුද්ධිවාදී (Rational) බවත් සඳහන් වේ. විද්‍යාව පිළිබඳ මේ සියලු මත ප්‍රලාපයන් බව තෝමස් කුන්ට සිය ගවේෂණයේ දී අවබෝධ විය. තමා එහි දී ලබාගත් දැනුම මත පදනම් ව කුන් සිය ශාස්ත්‍රීය ජීවිතයේ අග්‍ර ඵලය වන "විද්‍යාත්මක විප්ලවයන්හි ව්‍යුහය (Structure of Scientific Revolution) නමැති කෘතිය සම්පාදනය කළේ ය. මෙම කෘතිය බටහිර විද්‍යාවේ පදනම දෙදරුම් කැවීමට සමත් විය. එහි බලපෑම බටහිර විද්‍යාවට පමණක් සීමා නො වී දර්ශනය, සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව හා ඉතිහාසය ආදී විවිධ විෂයයන් කරා ද පැතිර ගියේ ය. මෙම කෘතිය ලෝකයේ භාෂා 16කට පමණ පරිවර්තනය වු අතර එහි පිටපත් දශ ලක්ෂ ගණනින් විකිණිණි. අදටත් එය විද්‍යාවේ දර්ශනය හා ඉතිහාසය පිළිබඳ පාඨමාලා සඳහා අනිවාර්ය ග්‍රන්ථයක් ලෙස නිර්දේශ කරනු ලැබේ.

මෙම කෘතියෙහි ඉතා වැදගත් සංකල්ප කිහිපයක් කුන් ඉදිරිපත් කරයි. ඔහු ගේ මෙම නිර්මාණාත්මක සංකල්ප අතුරින් සුසමාදර්ශය (Paradigm) විද්‍යාඥ ප්‍රජාව (Scientific Community) හා අසම්මේයතාව (Incommesurability) ප්‍රධාන වේ. කුන්ට පෙර සිටි විද්‍යා දාර්ශනිකයන් උත්සාහ කළේ විද්‍යාත්මක ක්‍රමයක් නිර්දේශ කිරීමට ය. උද්ගාමී ක්‍රමවේදය (Inductive Methodology) කල්පිත හා බැඳුණු නිගාමී ක්‍රමවේදය (Hypothico Deductive Methodology) සත්‍යාපන ක්‍රමවේදය (Verification Methodology) හා අසත්‍යාපන ක්‍රමවේදය (Falsification Methodology) එසේ නිර්දේශ කරන ලද ක්‍රමවේදයන් කිහිපයකි. තමා කිසි ම ක්‍රමවේදයක් විද්‍යාඥයන්ට නිර්දේශ (Prescribe) නො කරන බවත්, තමා කරන්නේ විද්‍යාවේ සිදු වන ක්‍රියාවලීන් (Process of Science) විස්තර කිරීම (Describe) පමණක් බවත් කුන් කියා සිටියේ ය. ඔහු ගේ දාර්ශනයේ කේන්ද්‍රීය සංකල්පය සුසමාදර්ශය (Paradigm) යැයි කිව හැකි ය. මෙය තේරුම් කිරීමට තරමක් අපහසු සංකල්පයකි. කුන් "විද්‍යාත්මක විප්ලවයන්හි ව්‍යුහය" නැමැති සිය කෘතියෙහි ද සුසමාදර්ශය යන්න පහත දැක්වෙන පරිදි පැහැදිලි කරයි. එනම් බටහිර විද්‍යාවේ ඕනෑ ම ක්ෂේත්‍රයක පදනම් ප්‍රවාදයක් හෝ ප්‍රවාද කිහිපයක් හඳුනාගත හැකි ය. එම පදනම් ප්‍රවාදවල පසුබිමෙහි නොයෙකුත් උපකල්පනයන් හා එම ප්‍රවාද(ය) ඇසුරෙන් ලෝකය දකින ආකාරය (ලෝක දෘෂ්ටිය) සැඟව ඇත්තේ ය. මෙම පදනම් ප්‍රවාද(ය) සමඟ පසුබිමෙහි ඇති උපකල්පන, දෘෂ්ටිය ඇතුළු නොයෙක් දේවලින් සමන්විත සමස්තය සුසමාදර්ශය ලෙස දළ වශයෙන් සැලකිය හැකි ය. මෙකී සමස්තය විද්‍යාඥ ප්‍රජාවක (Scientific Community) ගේ ශාස්ත්‍රීය ගමනේ දී අනුගමනය කරන්නා වු විනය න්‍යායක් (Disciplinary matrix) හෙවත් සීල ප්‍රතිපදාවක් ලෙස එක් ආකාරයකට යොදා ගැනෙයි. පදනම් ප්‍රවාදයක් හෝ ප්‍රවාද කිහිපයක් සහ පසුබිමෙහි ඇති උපකල්පන, ලෝක දෘෂ්ටිය වැනි දේවලින් සමන්විත සමස්තයක් විද්‍යාඥ ප්‍රජාව ගේ සීල ප්‍රතිපදාවක් ලෙස ක්‍රියාත්මක වන විට එම සමස්තයට සුසමාදර්ශයක් යැයි කිව හැකි ය. මෙම සුසමාදර්ශය මගින් ලෝකය (හෝ විශ්වය) සමන්විත වන්නේ කිනම් දේවලින් ද, එවා එකිනෙක සමඟත් මිනිසා ගේ පංචේන්ද්‍රියන් සමඟත් අන්තර්ක්‍රියා කරන්නේ කෙසේ ද, මේවා පිළිබඳව අර්ථාන්විතව නැගිය හැකි ප්‍රශ්න මොනවා ද, අදාළ ප්‍රවාදයට සාක්ෂි වශයෙන් සැලකිය හැක්කේ කුමන දේ ද, අදාළ විද්‍යා ක්ෂේත්‍රයට කේන්ද්‍රීය වන ප්‍රශ්න මොනවා ද, එවැනි ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් සැලකිය හැක්කේ මොනවා ද, සැලසුම් කළ යුතු පර්යේෂණ මොනවා ද, අදාළ විද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රපංච සඳහා දිය හැකි පැහැදිලි කිරීම් කවරේ ද යන ප්‍රශ්නාවලියට ලබා දෙන පිළිතුරු සමුදාය (කුලකය) සුසමාදර්ශයක් විසින් තීරණය කරනු ලබයි.

මීට ඉහත ද සඳහන් කළ පරිදි බටහිර විද්‍යාවේ නිසංසලව ගලා යන දීර්ඝ වකවානු හෙවත් සාමාන්‍ය විද්‍යාව ක්‍රියාත්මක වන වකවානු බහුල ය. මෙකී සාමාන්‍ය විද්‍යා වකවානුවල දී සිදු වන්නේ අදාළ ක්ෂේත්‍රය තුළ විද්‍යාඥ ප්‍රජාව අතර සම්මත වී ඇති සුෂුමාදර්ශය මත පදනම් ව පර්යේෂණ හා අනෙක් ශාස්ත්‍රීය කටයුතු කරගෙන යාමයි. මේ වකවානුවල දී සුෂුමාදර්ශය කිසි ම ලෙසකින් ප්‍රශ්න කිරීමට හෝ සැකයට හෝ භාජනය නො වේ. එහෙත් මෙසේ කටයුතු සිදු වන අතර සුසමාදර්ශය මත පදනම් ව කෙරෙන පරීක්ෂණවලින් ලැබෙන අනාවැකි අසාර්ථක වන අවස්ථා සහ අදාළ ක්ෂේත්‍රයේ හඳුනාගත් යම් ප්‍රපංච පැහැදිලි කිරීමට නොහැකි අවස්ථා ඉඳහිට හමු වේ. මෙසේ සම්මත සුසමාදර්ශයක් සමග නො පෑහෙන අවස්ථා විද්‍යාඥ ප්‍රජාව අතර ප්‍රබල කම්පන ඇති කිරීමට සමත් වන්නේ නම් විද්‍යාඥ ප්‍රජාව අතර එම සුසමාදර්ශය පිළිබඳ විශ්වාසය පලුදු වීමට පටන් ගනී. මේ අතර වෙනත් විකල්ප ප්‍රවාද අර්බුදයට තුඩු දී ඇති සුසමාදර්ශයට පදනම් ව ඇති ප්‍රවාදයට අභියෝග කිරීම ද සිදු වෙයි. එක්තරා අවස්ථාවක දී පවතින සුසමාදර්ශය ප්‍රතික්ෂේප කර විකල්ප සුෂුමාදර්ශයක් පිළිගැනීමට විද්‍යාඥ ප්‍රජාව විසින් තීරණය කරනු ලබයි. මෙවන් අවස්ථාවක් විද්‍යාවේ විප්ලවයක් ලෙස තෝමස් කුන් හැඳින්වී ය.

නිදසුනක් ලෙස සෞරග්‍රහ මණ්ඩලය පිළිබඳ ටොලමි ගේ සුසමාදර්ශය විස්ථාපනය වී කොපර්නිකානු සුසමාදර්ශය පිළිගැනීම විද්‍යාවේ සිදු වූ එක් විප්ලවයකි. භෞතික විද්‍යාවේ නිව්ටෝනියානු සුසමාදර්ශය විසි වී ගොස් අයින්ස්ටයිනියානු සුසමාදර්ශය එතැනට පත් වීම තවත් විප්ලවයකි.

විද්‍යාවේ විප්ලවයක දී සිදු වන සුසමාදර්ශ පෙරළියක දී නව සුසමාදර්ශය හා පැරණි සුසමාදර්ශය අතර කිසි ම සම්බන්ධතාවක් නැතැයි තෝමස් කුන් තවත් ආන්දෝලනාත්මක මතයක් ඉදිරිපත් කළේ ය. මේ අරභයා කුන් අසම්මේයතාව (Incommesnsurability) නමැති තවත් නව සංකල්පයක් ඉදිරිපත් කළේ ය. එනම් විද්‍යාවේ විප්ලවයක දී සිදු වන සුසමාදර්ශ පෙරළියේ දී පිළිගැනීමට ලක් වන නව සුසමාදර්ශය හා ප්‍රතික්ෂේප වූ මුල් සුසමාදර්ශය එකිනෙකට අසම්මේය (Incommesurable) වේ. ප්‍රවාද දෙකකින් එක් ප්‍රවාදයක් මඟින් ඉදිරිපත් කෙරෙන දෑ අනෙක් ප්‍රවාදයේ අඩංගු සංකල්පවලින් ප්‍රකාශ කළ නොහැකි නම් එම ප්‍රවාද දෙක අසම්මේය වේ. වෙනත් වචනවලින් කිව හොත් අසම්මේය ප්‍රවාද දෙකක් එක ම මිනුම් දණ්ඩකින් සංසන්දනය කළ නොහැකි ය. තෝමස් කුන් විද්‍යාවේ සිදු වන විප්ලව හෙවත් සුෂුමාදර්ශ පෙරළි පැහැදිලි කිරීමට කදිම උපමාවක් ද ගෙනහැර දැක්වී ය. එනම් එවැනි විප්ලවයක දී අදාළ ප්‍රජාව වෙනත් ආගමක් වැළඳ ගැනීම වැන්නක් සිදු වන බව කුන් පැවසී ය. එසේ නම් ප්‍රතික්ෂේප වූ මුල් සුෂුමාදර්ශය මත පදනම් ව ගොඩනැගුණු දැනුම් සම්භාරය එම සුෂුමාදර්ශයට සාපේක්ෂව වලංගු හා සංගත වේ. එය එක්තරා ආකාරයකට ලෝකය දෙස බැලීමකි. නව සුෂුමාදර්ශය මත පදනම් ව ගොඩනඟන නව දැනුම් සම්භාරය නව සුෂුමාදර්ශයට සාපේක්ෂව වලංගු හා සංගත වේ. මේ අනුව බටහිර විද්‍යාවේ යම් වකවානුවක දී යම් ක්ෂේත්‍රයක පවතින දැනුම් සම්භාරය එම වකවානුවේ දී ක්‍රියාත්මක වන සුෂුමාදර්ශයට සාපේක්ෂ යැයි තර්කානුකූලව නිගමනය කළ හැකි ය. මේ හේතුවෙන් බටහිර විද්‍යාඥයන් හා දාර්ශනිකයන් විසින් කුන් දැඩි විචාරයට ලක් කරන ලදී. මෙම දැඩි විවේචනය ඉදිරියේ කුන් තරමක පසුබෑමකට ලක් විය. තමා දැනුම් සම්බන්ධව සාපේක්ෂතාවාදියකු නො වේ යැයි ඔහු අවධාරණය කළේ ය. විද්‍යාවේ විප්ලවයක දී සිදු වන සුෂුමාදර්ශ පෙරළියේ දී නව සුෂුමාදර්ශය හා මුල් සුෂුමාදර්ශය අසම්මේය වන නමුත් එවා වක්‍ර ආකාරයෙන් සංසන්දනය කළ හැකි යැයි දුර්වල පිළිතුරක් ඔහු ලබා දුන්නේ ය. නව සුෂුමාදර්ශය මත පදනම් ප්‍රහේළිකා (Puzzels) වැඩි සංඛ්‍යාවක් විසඳිය හැකි යැයි කුන් පැවසී ය. කෙසේ නමුත් කුන් ඉදිරිපත් කළ සුෂුමාදර්ශය හා අසම්මේයතාව යන සංකල්ප මඟින් දැනුමේ සාපේක්ෂතාව තහවුරු කෙරෙන බව පැහැදිලි විය යුතු ය.

නලින් ද සිල්වා ඉදිරිපත් කර නිර්මාණාත්මක සාපේක්ෂතාවේ දී ඔහු සුෂුමාදර්ශයට වඩා ගැඹුරු වූ ද පුළුල් වූ ද චින්තනය නැමැති නව සංකල්පය නිර්මාණය කරයි. සුෂුමාදර්ශයකට පදනම් වන ප්‍රවාදයක් හෝ ප්‍රවාද පවතී. එහෙත් චින්තනයට පසුබිම් වන්නේ මිනිසා ගේ පංච ඉන්ද්‍රියයන්, මනස හා ඔහු අයත් වන සංස්කෘතියයි. පදනම් ප්‍රවාද ඇතුළු සියලු ප්‍රවාද ඉහත සඳහන් මිනිස් ඉන්ද්‍රිය පද්ධතියට, මනසට හා සංස්කෘතියට සාපේක්ෂව නිර්මාණය කෙරෙයි. නිදසුනක් වශයෙන් බටහිර වෛද්‍ය විද්‍යාව බටහිර චින්තනය තුළ නිර්මාණය වූ දැනුම් පද්ධතියක් වන අතර, ආයුර්වේද වෛද්‍ය විද්‍යාව ඉන්දියානු හින්දු (වෛදික) චින්තනය තුළ නිර්මාණය වූ දැනුම් පද්ධතියකි. මේ සම්බන්ධයෙන් වෙන ම ලිපියක් ලිවිය යුතු නමුත් මෙම ලිපිය තෝමස් කුන් ගේ සාපේක්ෂතාවාදී අදහස්වලට සීමා වෙයි.

*ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයයේ*
*ඉංජිනේරු ගණිත හා දර්ශන අංශයේ කථිකාචාර්ය*
**නෙම්සිරි ජයතිලක**